# බර වාහන බල පත්‍රය

ශ්‍රියානි පෙරේරා

කාන්තාවන් ගැන සිතීමෙන් ඇතැම් පිරිමින් උමතු වන බව කියති. මේ ගැන මා පුදුම නොවන්නේ අප කරන කියන ඇතැම් දේ ගැන යළි මෙනෙහි කරද්දී අපටම පිස්සු හැදෙන නිසාය. එසේ වූ කල අසරණ පිරිමින් ගැන කියනුම කවරේද ?

ජීවිතයේ යම් අවස්ථාවලදී ස්ත්‍රී සන්තානයේ අපූරු සිතුවිලි පහලවෙයි. මින් සමහරක් කිසිම තේරුමක් නැති ඒවාය. ඒත් එකී අවස්ථාවට අනුව අප සිතන්නේ එතරම් හොඳ අදහසක් තවත් නැතැයි කියාය. එය එසේ නොවන බව කවුරු පෙන්වා දුන්නත් අප ඒ බව පිළිග න්නේ නැත. අපේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා අපි බොහෝදුර යන්නෙමු. කැපකිරීම්ද කරන්නෙමු.

ඇතැම්විට අප ඉලක්ක කරගන්නා දේ අපේ ගැහැණු කමට නොගැලපේ. තවත් විටෙක එය අපේ තත්වයට ඔරොත්තු නොදේ. ඒ සඳහා යන ගමනේදී අපට ලෝකයාගේ උසුළු විසුළු වලට බඳුන්වීමටද සිදුවෙයි. අවසානයේ එම සියලු වද වේදනා විඳ අත්පත් කරගන්නා දෙයින් අප ලබන ප්‍රයෝජනයක් ද නැත. අප තුළ ඇත්තේ එය අත්පත් කරගැනීමේ දැඩි අවශ්‍යතාව පමණකි. නිවන් දොර සිටින උපාසක අම්මා කෙනෙකු වුවද තමා දුක් මහන්සි වී ලබාගත් දේ බදාගෙ න ඉන්නවා මිසක අතහරින්නේ නම් නැත.

මා විසින් එසේ අත්පත් කර ගත් යමක් පිළිබඳ තොරතුරු ඔබ හා බෙදාගැනීම මේ ලිපියේ අරමුණයි. (මේ කතාවේදී මා පාවිච්චි කරන්නේ පුද්ගලයින්ගේ සැබෑ නම් නොවේ.) මාත් මගේ මිතුරිය සුදර්මාත් මේ වික්‍රමය කළේ අප වයස විසි ගණන් වල සිටියදීය. එහෙත් හතළිස් පණස් ගණන් වල ඉන්නා වැඩිහිටි කාන්තාවන්ද මෙවැනි මෝඩකම් කරනු ඔබ දැක ඇතුවාට සැක නැත. ඔබ සැබැවින්ම

> ***'ගෑණියෙක් නේද ?' කඩපලක රැස්ව සිටි වයස්ගත ගැමියන් පිරිසක් එකිනෙකාගෙන් විමසනුද අපට ඇසිනි. තවත් ටික දුරක් යද්දී බයිසකල් රෝදයක් එලවාගෙන අප යන දෙසටම යමින් සිටි අවුරුදු 10 - 12 වයසේ කොලු රෑනක් හුම විය. ඔවුහු කොතරම් උද්දාමයට පත්වූවාදැයි කියතොත්ත 'මෙන්න ගෑනියෙක් ලොරියක් එලෝනෝ !' කියමින් සෑහෙන දුරක් ලොරිය පසුපස පන්නාගෙන එන්නටද වූහ.***

වාසනාවන්ත නම්, මෙවැනි කාන්තාවක් ඔබ නිවසේම සිටින්නටද පුළුවන.

රතු පැහැති මෝටර් රථයක් පිළිබඳ සිහිනයක් මා තුළ පිළිසිඳියේ කුඩා දැරියකව සිටියදී තෑගි ලැබුණු පින්තූර පොතක් නිසාය. අධ්‍යාපන කටයුතු නිසා යටපත්ව තිබූ සිහිනය රැකියාවක් ලද විගස යළිත් ඉස්මතු විය. වාහන පැදවීම කැමැත්තෙන් සිටි තවත් තරුණියන් දෙදෙනෙකු මගේ සේවා ස්ථානයේ වූයෙන් අපි ඒ සඳහා පානදුර නගරයේ රියදුරු පාසලක පහිට පැතීමු.

මේ වන විට මගේ පාසල් මිතුරියක වූ සුධර්මා විවාහයට සූදානම් වෙමින් සිටියාය. ප්‍රදේශයේ ප්‍රසිද්ධ ව්‍යාපාරික පවුලකට අයත් වෘත්තිකයෙකු ඇයට යෝජනා කර තිබිණි. ඔවුන්ට වාහන විකුණුම් පොළක් (car sale) ඇතුළු ව්‍යාපාර බොහෝමයක් විය. විවාහයට පෙර රියදුරු බලපත්‍රයක් ලබාගනු රිසි වූ සුධර්මාද අප හා එක්වූවාය. ගෑණු ළමිස්සියන් සිව් දෙනෙකුට එකවර රියදුරු පුහුණුව ලබාදීමේ දුර්ලභ වාසනාව හිමිවූ මැදිවියේ රියදුරු උපදේශකයා ගැන මෙය කියවන පිරිමි ඊර්ෂියා නොකරත්වා !

අප තිදෙනා සුක්කානම හුරු වුයේ තරමක් බියමුසුව වුවද, සුධර්මා ආරම්භයේ සිටම පුරුදු කාරියක මෙන් සුක්කානම හැසිරවූවාය. සෑම ක්‍රියාකාරකමක්ම ක්ෂණිකව ඉගෙන ගැනීමටත්, විශ්වාසනීයත්වයකින් යුතුව ක්‍රියාවට නැගීමටත් ඇය තුළ වූයේ පුදුම දක්ෂකමකි. පසුපසට පැදවීම (reversing), ක්ලච් බැලන්ස් කිරීම (Clutch balance) හා U turn ගැසීම වැනි අප බොහෝ වෙහෙස වී පුරුදු වූ දේ සුධර්මා කජු කන්නාක් මෙන් විය.

කාර් බලපත්‍රය වෙනුවට බර වාහන බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරමුදැයි යෝජනා කළේ සුධර්මාය. ඒ ඇයිදැයි මම නොදනිමි. ඇතැම්විට තමා තුළ වූ සහජ දක්ෂතාවයේ නිම් වලළු පුළුල් කරගන්නට ඇයට අවශ්‍ය වූවා විය හැක. අනෙක් මිතුරියන් දෙදෙනා ඒ ගැන උනන්දු නොවූ නමුත් මගේ ගැහැණුකම විසින් මා ඒ සඳහා පොළඹවනු ලැබීය.

මෙය තේරුමක් නැති වැඩක් බව මගේ මව කොතකුත් කියා සිටි නමුත්, මට අවශ්‍ය වූයේ කරන දෙය (බැරි මරගාතේ වුව) ඉහලින්ම කිරීමටය. බර වාහන සඳහා පුහුණුව අවශ්‍ය කරන බස් රථයක් පානදුර රියදුරු පාසලේ නොතිබුණ නිසා, ඔවුහු අප ඔවුන්ගේ කළුතර ශාඛාවට යොමු කළහ.

තමන්ට අවශ්‍ය පමණට වැඩ කටයුතු කරගත් අනෙක් මිතුරියන් දෙදෙනා කාර් පුහුණුව අවසානයේ පරීක්ෂණයට පෙනී සිටිද්දී වැඩි වැඩ කරනු රිසිවූ සුධර්මාත් මාත් දුර කතර ගෙවාගෙ න කළුතර ගොස් පුහුණුව සම්පූර්ණ කළෙමු. ලොකු වන්දනා බස් රථයක් නියමිත පැය ගණන එළවා පුහුණුවූ පසු අපටද පරීක්ෂණයට දින ලැබිණි. එහෙත් අප බස් රථයෙන් ලැබූ පුහුණුව ප්‍රමාණවත් නොවන බවට සංකාවක් අප තුළ විය.

සුධර්මාගේ ඥාති සහෝදරයෙකුට මොරටුවේ ලී බඩු සාප්පුවක් විය. ඒ සති අන්තයේ සරත් අයියාගේ ලොරියක් ව්‍යාපාර කටයුත්තක් සඳහා ඇල්පිටි යන බවත්, අපට එය පදවා පුහුණු විය හැකි බවත් සුධර්මා කියා සිටියාය. මම එකඟ වීමි.

ගාලු පාරේ පානදුර-කළුතර අතර ප්‍රදේශය අනතුරුදායක බැවින් කළුතර නගරය දක්වා සරත් අයියා ලොරිය පදවාගෙන ගියේය. කළුතර බෝධියට පඬුරු දමා ආරක්ෂාව පැතූ අපි 'එල්' බෝඩ් එකද එල්ලාගෙන අපේ වික්‍රමයට සූදානම් වීමු. කළුතර සිට අම්බලන්ගොඩ දක්වා සුධර්මාත්, අම්බලන්ගොඩ සිට ඇල්පිටිය දක්වා මාත් ලොරිය පැදවිය යුතු බවට එකඟතාවයක් විය.

සුධර්මා ඇයට හුරු පුරුදු විශ්වාසනීයත්වයෙන් ලොරිය පැදවූ නමුත්, මග තොටේ ඉන්නා මිනිසුන්ට එය අරුමයක් විය. ලොරියක රියදුරු අසුනේ ගැහැණියක සිටිනු දකින විට අප ඉදිරියට එන වාහනවල රියදුරන්ගේ මුහුණුවල විමතියක් සටහන් වෙනු අපි හොඳාකාරව දුටුවෙමු. මේ (1986 වසරේ ශ්‍රී ලංකාව බව යළිත් මතක් කර දෙනු කැමැත්තෙමු.) බේරුවල හරියේදී ඉදිරියෙන් ආ ලොරියක තරුණ රියදුරෙකු හිස පිටතට දමා මොකද්දෝ කියා කෑ ගැසූ නමුත්, මුහුදේ ඝෝෂාව නිසා එය අපට ඇසුනේ නැත. එහෙත් ඔහු හැසිරුණු ආකාරයෙන් එය කට කැඩුණු කතාවක් බව අපි පසක් කර ගතිමු.

නරඹන්නන්ගේ ආශ්වාදය වැඩි දියුණු වූයේ අම්බලන්ගොඩ සිට ඇල්පිටිය දක්වා වූ ගම්මාන හරහා මා ලොරිය පදවාගෙන යද්දීය. පාරේ ඇවිදගෙන ආ ගැමියන් මා දැකීමෙන් මිවතයට පත්ව, තම ආ ගමන අමතක වූ සෙයින් නැවතී බලා සිටියේ වතාවක් දෙකක් නොවේ.

'ගෑණියෙක් නේද ?' කඩපලක රැස්ව සිටි වයස්ගත ගැමියන් පිරිසක් එකිනෙකාගෙ න් විමසනුද අපට ඇසිනි. තවත් ටික දුරක් යද්දී බයිසකල් රෝදයක් එලවාගෙන අප යන දෙසටම යමින් සිටි අවුරුදු 10 - 12 වයසේ කොලු රෑනක් හුම විය. ඔවුහු කොතරම් උද්දාමයට පත්වූවාදැයි කියතොත්ත 'මෙන්න ගෑනියෙක් ලොරියක් එලෝනෝ !' කියමින් සෑහෙන දුරක් ලොරිය පසුපස පන්නාගෙන එන්නටද වූහ.

ඉතින් මෙතරම් කරදර වී ලෝකයා හිනස්සා ලබාගත් බරවාහන බලපත්‍රයෙන් මා ලැබූ ප්‍රයෝජනය කුමක්දැයි ඔබ ප්‍රශ්න කරන්නට ඉඩ ඇත. පිළිතුරු 'කිසිත් නැත' යන්නයි. වසර කිහිපයක ඇවෑමෙන් මගේ ඒකායන ප්‍රාර්ථනය වූ රතු පැහැති කාරයක හිමිකාරිය වන්නට මා වාසනාවන්ත වූ නමුත්, එය 1200 CC ප්‍රමාණයේ කුඩා මෝටර් රථයක් විය. A ශ්‍රේණියේ බර වාහන බලපත්‍රයක් හිමි වුවද, මා විදේශගත වන තුරුත් පැද වූයේත් එම නිසාන් රථය පමණි.

සුධර්මාගේ කතාව ඊටත් වඩා රසවත්ය. ඇය විවාහ වූ අළුතම ගැබිනියක වූ නිසාත්, ඉන්පසු දරුවන්ගේ වැඩට වෙහෙසෙන්නට වූ නිසාත්, රිය පැදවීමේ අවස්ථාව අහිමි විය. වසර කිහිපයකදී උසස්වීමක් ලැබූ ඇගේ සැමියාට නිලරථයක් හා රියදුරෙකු ලැබුණු නිසා, ඉන් පසු ඇයට රිය පදවන්නට අවශ්‍ය වූයේ නැත.

ඇය කොතරම් දක්ෂතාවයෙන් හෙබි අයෙකු වුවද, රියදුරු පරීක්ෂණයට පෙනී සිටීමෙන් පසු එක් වතාවක් හෝ සුක්කානමක් හසුරවන්නට ඉඩ ලැබී නැත. දශක දෙකකට පසු දැන් ඇයට ඒ සඳහා ආශාවක්ද නැත. ඒ කාලයේ රියදුරු බලපත්‍රය වශයෙන් ලැබුණු පොත තවමත් සිය අල්මාරියේ සුරැකිව ඇති බව ඕ මෑතකදී මා හා කීවාය.

'ඉතිං වැඩක් නැත්තං ඕක තියාගෙන ඉන්න ඕනැයැ' ගාමිණී (සුධර්මාගේ සැමියා) කීය

'එහෙම අහක දාන්න පුළුවන්ද අපි ඒක ගන්න කරදර වෙච්ච විදියට ?'

'විහින් කරදර වුණාට කවුරුත් පළියැ. කාර් ලයිසන් අරන් නිකං හිටියනං ඉවරනේ.' ගාමිණී කීවේ මා දෙසද බලමිනි.

'මොකද හැබෑවටම ඔයාට හිතුනෙ ලොරි ලයිසන් ගන්න ?'

ගාමිණී යලිත් සිය බිරිඳ දෙසට හැරුනේ මේ අපබ්‍රංහය තේරුම්ගත නොහැකිවය.

'අනේ ඔය තරුණ කාලේ කරපු දේවල් වලට දැන් හේතු කාරනා හොයන්න එපා.' සුධර්මා සැමියාට සැර වුනාය.

'ඒ වයසට කවුරුත් සෝබන වැඩ කරනවනේ. එහෙනං ඔයත් ඒ කාලේ මෙයාව බලන්න එනකොට එක එක මෝස්තර කාර්වල ආවේ.'

මමද මිතුරිය වෙනුවෙන් වග උත්තර බැන්දෙමි.

'ඒක තමයි ! ඒවා ඕගොල්ලන්ගේ සේල් එකේ විකුණන්න තිබ්බිච කාර්නේ.' සුධර්මා ක්ෂණිකව ඉදිරිපත් වුනාය.

'මහ ලොකුවට අරන් ආවට ඒ එකක්වත් ඔයාගෙ නෙමෙයිනේ හැමදාමත්, හැමතැනදිමත් සිදුවන්නාක් මෙන්, මෙතනදීද ගැහැණු අපි කටින් ගසා ජය ගත්තෙමු.




**නිවාස සහ ඉඩකඩම් නවීකරණය කරගැනීමට**

**ඔබ සිතනවාද?**

**SETSQUARE PROPERTY**
DEVELOPMENT

ARCHITECTURAL DESIGNS FOR

Subdivisions
(Make use of your Large Backyard)

New Homes/Units
Development Plans

Extensions and Renovations

COVERS ALL SUBURBS
For Obligation Free Consultations

saamArt

Contact - Asanka Jayawardena
Mob : 0402 443 554 Tp : 9323 7393
asankapj@gmail.com